


# පාලු ගෙදර අබිරහස

මින්සඳි නෙලිත්මා විජේසිංහ

# පාලු ගෙදර
# අබිරහස

**මින්සඳි නෙලිත්මා විජේසිංහ**

**5 ශ්‍රේණිය C**

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

# පාලු ගෙදර අබිරහස

**කර්තෘ**
මින්සඳි නෙලිත්මා විජේසිංහ

---

**ISBN 978-624-208-471-8**

---

**කතෘගේ වෙනත් කෘති**
පුංචි ගගුලි - 2021
යාළුවෝ පස්දෙනයි වඳුරු රැළයි - 2023

---

**කෘතිය පළ කරන දිනය**
2025. 02. 08

---

**ප්‍රථම මුද්‍රණය**
2025 පෙබරවාරි 08

---

**මුද්‍රණය**
පන්හිඳ ප්‍රින්ටර්ස්, මහනුවර
071 8 822 822

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකොමත් එක රටක ෂීප්රිජ් කියලා නගරයක් තිබුණා. ඒ නගරෙ මාග්‍රට් කියලා ගෑනු ළමයෙකුයි, එලී කියලා ගෑනු ළමයෙකුයි හිටියා. ඒ නගරේම රොනල්ඩ් සහ ලීප් කියලා පිරිමි ළමයි දෙදෙනෙකුයි හිටියා. මේ හැමෝම හොඳ යාළුවෝ.

එයාලා අබිරහස් විසඳන්නත් දක්ෂයි. ඒවාට උදව් කෙරුවේ ලින්ඩි කියන බල්ලා. ඌ ස්කෝට් වර්ගයේ බල්ලෙක්. එයාලා දැනට අබිරහස් තුනක් විසඳලා ඉවරයි.


එලී
රොනල්ඩ්

එක දවසක් උදේ මේ අය ගඟ ගාවට පික්නික් එකක් ගියා. එදා අඳුරු දවසක්. ඒ යනකොට යාළුවෝ පාලු ගෙදරක් පහු කරගෙනයි ගියේ. ඒ ගෙදර නම ග්‍රීන්ට්‍රීස්. මේ ගෙදර කාමරයක ලයිට් එකක් පත්තු වෙනවා එලී දැක්කා. ඒ ගෙදර පසු කරද්දි ලින්ඩි බිරුව නිසා එතන විශේෂත්වයක් ඇති කියලා හිතපු එලී රොනල්ඩ්ට කතා කළා.

"අර බලන්න, ඒ කාමරේ ජනේලේ එළියයි. අනෙක් කාමරවල ජනෙල් අඳුරුයි. එතන මොකක් හරි විශේෂයක් ඇති කියලා හිතෙන්නැද්ද රොනල්ඩ්? ඔයා ගිහින් බලනවද?" එලී කිව්වා.

“ඔව් ඇත්තටම. මම ගිහින් බලන එක හොඳයි. ඔයාලා මෙතන මුර කරන්න.” රොනල්ඩ් කිව්වා.

“ඔව්, ඒක හොඳයි. කවුරුහරි කාමරේ ඉන්න පුලුවන් හින්දා ඔයා අර ගහට මුවා වෙලා ඉන්න.” ලීප්ගෙ උපදෙස එයයි.

“ඔයා අර ගහේ කාමරේට නැමුණු අත්ත දිගේ බඩ ගාගෙන යන්න. ඔයාගේ මූණ කොළ අත්තේ හංගගෙන ඔයාට ලේසියෙන්ම කාමරේ ඇතුළ බලන්නට පුළුවන්” ඒ මාග්‍රට්. රොනල්ඩ් ඒ ගහ ගාවට යන හැටි ගේට්ටුව ගාව හැංගිලා බලන් හිටිය ළමයි තුන්දෙනා දැක්කා.

රොනල්ඩ් ඒ ගහට නැඟ ගත්තේ බඩ ගා ගෙනය. ඔහුගේ ඇඳුම් දුඹුරු පැහැයට හුරු රතු පැහැයක් ගත්තෙන් කිසිවෙකුට ඔහු නොපෙනිණ. ඒ කාමරය දෙස බැලූ ඔහු එක්වරම තැති ගත්තේය. මිනිසුන් කිහිපදෙනෙකු එක්වී කතාබහ කරනු ඔහු දුටුවේය.

නමුත් කතාබහ ඔහුට නෑසුනේ එය පහත් හඬින් කළ බැවිනි. එම කාමරය තුළ කෙනෙකුට නිදාගත හැකි ආකාරයේ පුටුවක්, කුඩා කබඩයක්, දල්වන ලද විදුලි උඳුනක්, කුඩා මේසයක් සහ පුටුවක් වැනි තවත් බොහෝ දේ එහි වූවා. රොනල්ඩ් ගසෙන් බැස යාමට සැරසෙද්දි මිනිසුන් ජනේලය අසලට පැමිණ විවිධ දෑ කීවා. ඒවාද ඉතා සෙමින් කීමෙන් අසන්නට ලැබුණේ ඉතා ටිකයි. ඒවානම් ඝන මිදුම, වැස්ස, දවස පුරා වැනි වචනයි. ඉන්පසු ඔවුන් කාමරයෙන් පිටව ගියා. රොනල්ඩ් ද ගසෙන් බැස ගේට්ටුව අසල සිටි ළමුන් තිදෙනාට එකතු වුණා.



එදා හවස රොනල්ඩ් රැස්වීමක් කැඳෙව්වා. එම රැස්වීමේදී රොනල්ඩ් එයා දැකපු දේ විස්තර කළා. අන්තිමේදි එයා කිව්වා "කාටහරි අදහසක් තියෙනවනං කියන්න" කියලා. ටික වේලාවකින් මාග්‍රට්ට අදහසක් ආවා. "මේ අහන්න අපට බැරිද මේ ගෙදර දැනට ඉන්නෙ කවුද කියලා බලන්න.

සමහර විට ඒක විකුණලා වෙන්නත් පුළුවන්. අපි ඒ ගැන හොයලා බලන්න ඕන." මාග්‍රට් කිව්වා. "ඔව් ඇත්තෙන්ම තවත් අදහස් තියනවද?" ඒ රොනල්ඩ්.

එතකොටම එලී කිව්වා, "ඔව්. පාලු ගෙදර ඉඳන් ගේට්ටුව ගාවට තියෙන පාරේ අඩි සටහන් බැලුවොත් කොහොමද?" කියලා. එක අහපු ලීප් "එහෙනං අපි අඩි සටහන් බලන්න යන්න ඕන. පාලු ගෙදර ඇතුලේ කවුරුහරි ඉන්න පුලුවන් නිසා පරිස්සමින්. ජනෙල් වලින් කවුරුහරි බලන් හිටියොත් එහෙම." කියලා කිව්වා.

"ඔව් මාග්‍රට්. ඔයා ගිහින් දේපළ වෙළෙන්දාගෙන් දැන් ගෙදර ඉන්නේ කවුද කියන එක දැනගන්න. අනිත් අය ලින්ඩ්ත් එක්කම එන්න මාත් එක්ක. අපි යමු පාලු ගෙදර වත්තේ අඩි සටහන් හොයන්න" රොනල්ඩ් කිව්වා.

ඉතින් ඔවුන් ග්‍රීන්ට්‍රීස් නිවෙස වෙත ගිය අතර අසරණ මාග්‍රට් දේපළ වෙළෙන්දාගේ කාර්යාලය දක්වා ගියා. එතන සිටියේ අවුරුදු 20ක් පමණ පෙනුමැති තරුණයෙක්.  මාග්‍රට් ගිහින් ඇහුවා "මගේ නැන්දාට ගඟ අද්දරින් වගේ ගෙයක් ගන්න ඕන වෙලා තියෙනවා. එයා ගොඩක් කැමති ග්‍රීන්ට්‍රීස් වගේ ගෙදරකට. ඒක විකුණනවාද?" කියලා. එවිට "දැනටමත් ඒක ක්‍රම්ප් මෙනවිය අරගෙනයි තියෙන්නේ. එයාගේ ලිපිනය මිල්ටන් නිවස විලෝ පාර, පීටර්ස්වුඩ්. ඒක අහපු මාග්‍රට් යමක් සොයාගැනීමේ සතුටින් රොනල්ඩ්ගේ නිවස බලා ගියා.



එදා නැවතත් ඔවුන් රැස්වුණ වේලාවේ මාග්‍රට් ඇය දුටු දේ කිව්වා. රොනල්ඩ් ඔවුන් දුටු දේ විස්තර කළා. "අපි ගේට්ටුව ගාවට ගියා. ඊට පස්සේ ලින්ඩිට කිව්වා ගේ ඇතුළේ කවුරු හරි ඉන්නවා නම් බුරන්න කියලා. එයා බිරුවේ නෑ. එතන එලීව මුරට තියලා අපි ගියා.

එතන අඩි සලකුණු වර්ග 05ක් තිබ්බා. අපි ඒවා සටහන් පොතේ ඇඳගත්තා. ඒවගේම ඒවා ගිහින් තියෙන්නේ නිවසේ දොර දෙසට නෙවෙයි. ගල් අඟුරු වළ දෙසට. එතනින් පහළට ගිහින් බිම් ගෙය අස්සෙන් ගිහින් තියෙන්නෙ. ඉන් එහාට අපිට අඩි සටහන් හොයා ගන්න බැරි වුණා. දැන් අපි හෙට උදේ 10.00ට ක්‍රම්ප් මෙනවිය හම්බවෙන්න යමු. හැමෝම කිරි කඬේ ගාවට එන්න. මොනවාහරි කාලම යමු. "


පසුවදා උදේ 10.00 වෙද්දි හැමෝම කිරි කඩේට වෙලා රසම රස චොක්ලට් කේක්, ඩෝනට්, ඉක්ලියාස් සහ අයිස්ක්‍රීම් කමින් සිටියා. "අපි ගිහිල්ලා වතුර ටිකක් ඉල්ලමු. ඒ ගමන්ම කතාවට වැටෙන්න පුළුවන්." චොක්ලට් කේක් කැබැල්ලක් ගනිමින් ලීප් කිව්වා. සියලු දෙනාම නිහඬව එකඟතාව පළ කළේ හිස් ඉහළ පහල වනමිනි.

ඔවුන් යන්නට පිටත් වූ අතර ඒ වන විට තදින් ඉර පායා තිබූ නිසා ඔවුන් හතිළන්නට විය. ටිකකින් ඔවුන් පීටර්ස්වුඩ්වලට පැමිණි පාරේ සිටි ළමයෙකුගෙන් විලෝ පාර කොහේදැයි විමසීය. ඇය ඔවුන්ට එය පෙන්වීය. ඔවුන් එම පාර දිගේ යන විට මිල්ටන් නිවස හමු විණි.

ඔවුන් දොරට තට්ටු කළ අතර දොර විවෘත විය. "ඔහ්, අපට සමාවෙන්න. අපට වතුර ටිකක් ගන්න පුලුවන්ද? අපට බයිසිකල් පැදලා ගොඩක් මහන්සියි." රොනල්ඩ් කිවුවා. ඔයාලා කොහේ ඉඳන්ද? ඈත ඉඳන් වෙන්නැති" ඔවුන් වතුර බොද්දි කාන්තාව කිව්වා. "අපි ෂීප්රිජ්වල ඉඳන්" ඒ එලී.

"අනේ! අපි ෂීප්රිජ්වලින් ගෙයක් ගත්තා ග්‍රීන්ට්‍රිස් කියලා. හරිම ලස්සන තැන. එතකොට හෙන්රි ස්මිත් කියලා කෙනෙක් ඇවිත් මේ ගේ එයාට විකුණන්න කියලා ඉල්ලීමක් කළා. මම ඉතින් එයාට නිවස දුන්නා" ඒ කාන්තාව කිව්වා.

මෙතරම් තොරතුරු ප්‍රමාණයක් එකවර ලබා ගැනීම ගැන සතුටින් කාන්තාවට ස්තුති කළ ඔවුන් පිටව ගියා. ඒ යන අතරමඟ දී රොනල්ඩ් කිව්වා. "ඒලී, ලීප්, ඔයදෙන්නා හෙන්රි ස්මිත් ගැන හොයලා බලලා හෙට උදේ මඩුවට වාර්තා කරන්න." කියලා.



එදා උදේ කට්ටිය මඩුවට වෙලා එලීගෙයි, ලීප්ගෙයි කතාව අහනවා. ඒ කතාවෙන් තේරුණේ හෙන්රි ස්මිත් කියන්නේ ප්‍රසිද්ධ හොර කල්ලියක නායකයෙක් කියලා. ඉතින් ඔවුන් සියලු දෙනා ම පොලිස් ස්ථානයට ගියා. එහි සිටි සාජන්ට්වරයා ඔවුන්ව හඳුනනවා. ඔවුන් ඔහුට සිදුවුණ සියලු දේ කීවා.

සාජන්ට්වරයා ඇතුළු නිලධාරීන් පිරිස හොර කල්ලිය කොටු කර ගැනීමට සැලැස්මක් සකස් කළා.

පොලිස් නිලධාරීන් රොනල්ඩ්ට කීවේ එදින රෑයේ නිවස ඉදිරිපිට ගසේ අතු අතර සැඟවී සිට මිනිසුන් කාමරයට පැමිණියහොත් සංඥා කරන ලෙසයි. අනෙක් පොලිස් නිලධාරීන් ගස් අතර සහ පඳුරු අතර සැඟවී සිටියා.

රොනල්ඩ් ගේ සංඥාව ලැබුණු ගමන් තැන තැන සැඟව සිටි පොලිස් නිලධාරීන් පැමිණ ගෙය වට කර හොරුන් පිරිස පොලිස් බාරයට ගත්තා.



එවන් අවශ්‍යව සිටි හොරු පිරිසක් නීතියට හසුකර ගැනීමට උදවු කිරීම පිළිබඳව පොලිස් පරීක්ෂකතුමා රොනල්ඩ් ඇතුළු යාළුවන්ට ස්තූති කළා

නිමි !

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-471-8
978-624-208-471-8